**ශීර්ෂය 5 - අමාත්‍ය මණ්ඩල කාර්යාලය**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව, කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 01 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**--------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම
**------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව, සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර, ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2019 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ). ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ). අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ). | චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව, අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන, ඇමුණුම් ලෙස මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණනයේ නිරීක්ෂණ සමග එකඟ වෙමි. ප්‍රමාද දෝෂයක් හේතුවෙන් ඇමුණුම් ලෙස ඉදිරිපත් කර නොමැති අතර, ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් යළි ඇති නොවීමට වග බලා ගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. |
| (ආ). | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල, ඒසීඒ-එෆ් ආකෘතිය යටතේ වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වම්පස තිරුවෙහි 2018 වර්ෂයේ අයවැය සංඛ්‍යාත්මක අගයයන් දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණනයේ නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. අතපසුවීමකින් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල අයවැය තොරතුරු සටහන් වී නොමැති අතර, ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් යළි ඇති නොවීමට වග බලා ගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| (ඇ). | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල, අංක ඒසීඒ-2(iii) ආකෘතියෙහි අදාල තොරතුරු වාර්තා කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. අතපසුවීමකින් අයවැය තොරතුරු සටහන් වී නොමැති අතර, ඉදිරියේදී මෙම තත්ත්වය වළක්වා ගැනීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ). දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i). | මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-6 ආකෘතිය යටතේ වූ | මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන | සිගාස් වැඩසටහන තුළට ඇතුළත් කළ ආරම්භක ශේෂ දත්ත සකස් |

| | | | |
|---|---|---|---|
| | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වාර්තා කර තිබුණු වත්කම් වෙනුවෙන්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින්, 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් වාර්තාව (**Asset Report**) නිකුත් කර නොතිබුණි. | වත්කම් වාර්තා කිරීමේදී, 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.3, 8.1 සහ 8.2 ඡේද ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | කිරීමේදී සිදුවූ යම් යම් ගැටලුකාරී තත්ත්වයන් නිසා ස්ථාවර වත්කම් ලේඛනයේ සහ සිගාස් වැඩසටහනේ දත්ත අතර වෙනස්කම් ඇතිවිය. එම නිසා මූල්‍ය නොවන වත්කම් වාර්තාව නිකුත් කර නොමැති අතර, මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී කටයුතු කරමින් පවතින අතර, ඒ සඳහා එම දෙපාර්තමේන්තුව විසින් 2019.08.31 දින දක්වා කල් ලබාදී ඇත. |
| (ii). | මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-6 ආකෘතියෙහි 2018 ජනවාරි 01 දිනට රු.312,680 ක යතුරුපැදි ශේෂය, වර්ෂය තුළ රු.4,700,000 ක අත්පත් කරගැනීම් සහ රු.1,643,385 ක අපහරණයන්, 2018 දෙසැම්බර් 31 දිනට **CIGAS** වැඩසටහන අනුව වත්කම් ලේඛනයෙහි සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහනේ ලෙජර් ශේෂවල වාර්තා වී නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී, 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.3, 8.1 සහ 8.2 ඡේද ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | යතුරුපැදි ශේෂය සහ අපහරණ වටිනාකම් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විමසමින් කඩිනමින් සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. රු.4,700,000 ක් වටිනා මෝටර් රථයේ වටිනාකම 2019 ජනවාරි මාසයේදී සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත. |

### (ආ). අත්තිකාරම් ගිණුම් ශේෂ

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **කාර්යාලයේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ සමාලෝචිත වර්ෂය තුළ මුදලින් බැර කිරීම් රු.2,972,949 ක් සහ හරස් සටහන් මගින් බැර කිරීම් රු.1,002,938 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-5 ආකෘතිය මගින් අත්තිකාරම් ගිණුමට අදාල තොරතුරු වාර්තා කිරීමේදී, වර්ෂය | අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂය, මූල්‍ය ප්‍රකාශනවල අදාල ආකෘති ප්‍රකාරව දැක්විය යුතුවේ. | විගණනයේ නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. ප්‍රමාද දෝෂයක් හේතුවෙන්, මුදලින් බැරකිරීම් හා හරස් සටහන් මගින් බැර කිරීම් සියල්ලම එකතුවක් ලෙස ගෙන සටහන් කර ඇති අතර, ඉදිරියේදී මෙය නිවැරදිව ගිණුම්ගත කිරීමට |

| | |
|---|---|
| තුළ මුදලින් බැර කිරීම් සහ හරස් සටහන් මගින් බැර කිරීම්, පිළීවෙලින් 0 ක් සහ රු.3,975,887 ක් වශයෙන් වාර්තා කර තිබුණි. | සුපරීක්ෂාකාරි වන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. |

**(ඇ). ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛනය පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **කාර්යාලයේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **ආපදා ණය පොරොත්තු ලේඛණය**<br>ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 10 වගන්තිය, 2017 මාර්තු 09 දිනැති අංක 133(I) දරන ජාතික අයවැය චක්‍රලේඛය සහ 2007 අප්‍රේල් 20 දිනැති අංක 06/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පවත්වා නොතිබුණි. | ආයතන සංග්‍රහයේ සහ අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, ආපදා ණය පොරොත්තු ලේඛණයක් පවත්වා ගෙන යා යුතුවේ. | මෙම කාර්යාලයේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව සීමිත බැවින්, ආපදා ණය ඉල්ලුම්පත් සම්බන්ධයෙන් දැනට පොරොත්තු ලේඛනයක් නොමැති අතර, ඉදිරියේදී පොරොත්තු ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. |

**(ඇ). ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පණතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

| **නිරීක්ෂණය** | **නිර්දේශය** | **කාර්යාලයේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ ඡේදයේ 4.1 සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | දැනට මෙම කාර්යාලයේ පවතින ඉඩකඩ කිසිසේත් ප්‍රමාණවත් නොවන බැවින්, මෙම කාර්යාලය වඩාත් ඉඩකඩ සහිත වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමෙන් අනතුරුව, එම නිලධාරීනියට අවශ්‍ය පහසුකම් සලසා දීමට තීරණය කරන ලදී. එබැවින් මෙතෙක් අභ්‍යන්තර විගණක තනතුරේ කටයුතු මෙම කාර්යාලය තුළ සිදු කිරීමට හැකිවී නොමැති බව විගණනය වෙත පෙන්වා දෙනු කැමැත්තෙමි. |

**(ඉ). නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(i). ව්‍යවස්ථාපිත විධිවිධාන** | | | |
| 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 සහ 6 වන වගන්ති | සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.1,040,344 කට අදාල වවුචර් 13 ක නියැදියකට ගෙවීම් කිරීමේදී, අදාල මුද්දර ගාස්තු අයකරගෙන නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණනයේ නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. මේ වන විට රු.25,000 ට වඩා වැඩි ගෙවීම් සඳහා මුද්දර අලවා ගැනීමට හෝ මුද්දර වටිනාකම ඉන්වොයිසි වටිනාකමින් අඩු කර ගෙන ගෙවීම් කිරීමට පියවර ගෙන තිබේ. |
| **(ii). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මුදල් රෙගුලාසි 139(4), 260 සහ 264 | එකතුව රු.766,505 ක් වූ වවුචර් 23 ක ගෙවීම් නියැදියකට, වවුචරයෙහි සඳහන් දළ මුදල් ලැබුණු බවට ආදායකයාගේ අනන්‍යතාවය තහවුරු කර ගෙන නියමිත තැනැත්තාටම මුදල් ගෙවූ බවට සාක්ෂි නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණනයේ නිරීක්ෂණ සමග එකඟ වෙමි. ඉදිරියේදී භාණ්ඩ හා සේවා සපයන ආයතනවලට චෙක්පත් නිකුත් කිරීමේදී අදාල රිසිට්පත් ලබා ගැනීමට හා අදාල නිල මුද්‍රාව සටහන් කර ගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම, ප්‍රතිපාදන මාරු කිරීම, පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබා ගැනීම හා උපයෝජනය, ප්‍රතිපාදන උපයෝජනය කිරීම, ඉතිරිවීම් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ). | සමාලෝචිත වර්ෂය සඳහා සලසා ගෙන තිබුණු ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සහ ශුද්ධ ප්‍රතිපාදනවල එකතුව පිළිවෙලින් රු.15,200,000 ක් සහ රු.9,935,000 ක් වූ, පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සහ එක් ප්‍රාග්ධන වැය විෂයයක් යටතේ සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වියදමක් ගිණුම් ගතවී නොතිබුණු අතර, වර්ෂය අවසානයට එම වැය විෂයයන් 04 යටතේ සලසා ගෙන තිබුණු මුළු ප්‍රතිපාදන ඉතිරිවීම සියයට 100 ක් විය. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කර නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර, මුදල් රෙගුලාසි 127(4) සහ 127(5) ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදන මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුවේ. | විගණනයේ නිරීක්ෂණ සමග එකඟ වෙමි.<br>සාර්ක් කලාපීය අමාත්‍ය මණ්ඩල ලේකම්වරුන්ගේ රැස්වීම් 2018 වර්ෂය තුළදී නොපැවැත්වීම,<br>2018 වර්ෂයේදී මෙම කාර්යාලය කොළඹ 05, කැප්පෙටිපොළ මාවතේ පිහිටි ගොඩනැගිල්ල වෙත රැගෙන නොයාම,<br>රාජ්‍ය භාෂා පුහුණු වැඩසටහන් සඳහා දරන ලද පිරිවැය වැය විෂය අංක 2401 යටතේ ගිණුම් ගත කිරීම ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු විය. |
| (ආ). | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 05-01-01-1404 වැය විෂයය සඳහා සලසා ගෙන තිබුණු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.800,000 න්, කිසිදු වියදමක් දරා නොතිබුණු අතර, එම මුළු ප්‍රතිපාදනයම වෙනත් පුනරාවර්තන වැය විෂයයන් දෙකක් වෙත මුදල් රෙගුලාසි 66/69 විධිවිධාන ප්‍රකාරව මාරු කර තිබුණි. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කර නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර, මුදල් රෙගුලාසි 127(4) සහ 127(5) ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදන මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුවේ. | 2019 වර්ෂයේ මුල් කාර්තුවට අදාල වරිපනම් බදු ගෙවීමද ඇතුළත්ව මෙම වැය විෂයය යටතේ ප්‍රතිපාදන සලසා ගන්නා ලදී. එහෙත් 2019 වර්ෂය ආරම්භයේදී කාර්යාලය වෙනත් ස්ථානයක ස්ථානගත කිරීමට සැලසුම් කර තිබූ බැවින්, 2018 වර්ෂයේ ප්‍රතිපාදනවලින් 2019 වර්ෂයේ මුල් කාර්තුවට අදාල වරිපනම් නොගෙවීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරිය පෙන්නුම් කරනු ලබයි. |
| (ඇ). | 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා 05-01-01- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කර නිවැරදි | විගණන නිරීක්ෂණය සමග එකඟ වෙමි. එහෙත් සැලසුම් කළ පරිදි මෙම කාර්යාලය |

| | | | |
|---|---|---|---|
| | 1403 සහ 05-01-01-2001 දරන වැය විෂයයන් සඳහා සලසා ගෙන තිබුණු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවල එකතුව පිළිවෙළින් රු.16,200,000 ක් සහ රු.16,500,000 ක් වූ අතර, වර්ෂ 03 තුළ වැය විෂයයන් දෙකෙහි ඉතිරිවීම්, ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 100 ක් සහ සියයට 99 ක් විය. | ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර, මුදල් රෙගුලාසි 127(4) සහ 127(5) ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදන මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුවේ. | වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමට නොහැකිවීම හේතුවෙන් හා මෙම කාර්යාලයට පාලනය කළ නොහැකි වූ ඇතැම් කරුණු හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරිය සිදුවී ඇත. |
| (ඈ). | එක් පුනරාවර්තන වැය විෂයයක් සහ මූලධන වැය විෂයයන් 02 ක් සඳහා සලසා ගෙන තිබුණු රු.2,750,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.2,264,059 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණු අතර, එය සලසා ගෙන තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 76 ත් 85 ත් අතර පරාසයක ප්‍රතිශතයක් වී තිබුණි. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කර නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර, මුදල් රෙගුලාසි 127(4) සහ 127(5) ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදන මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුවේ. | මෙම කාර්යාලය වෙනත් ස්ථානයක ස්ථානගත කිරීමට සැලසුම් කර තිබූ බැවින්, අත්‍යවශ්‍ය අවම අලුත්වැඩියාවන් පමණක් සිදු කිරීම, අපේක්ෂිත පරිදි යන්ත්‍රෝපකරණවල අලුත්වැඩියාවන් සිදු නොවීම හා මෙම කාර්යාලය වෙනත් පරිශ්‍රයක ස්ථානගත කිරීමෙන් පසු අවශ්‍ය වායු සමීකරණ යන්ත්‍ර මිලදී ගැනීමට ප්‍රතිපාදන සලසා ගත් නමුත්, අපේක්ෂිත පරිදි මෙම කාර්යාලය වෙනත් පරිශ්‍රයක ස්ථාපිත කිරීමට නොහැකිවීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි විය. |
| (ඉ). | වැය විෂයයන් 08 ක් සඳහා සලසා ගෙන තිබුණු එකතුව රු.19,200,000 ක මූලික වියදම් ඇස්තමේන්තු, වර්ෂය අවසානයට එකතුව රු.10,265,000 ක් දක්වා සංශෝධනය කර ගෙන තිබුණු අතර, ඒ අනුව එම වැය විෂයයන් 08 හි මූලික වියදම් ඇස්තමේන්තු අගයයන්ගේ මුළු අඩුවීම සියයට 47 ක්ද, එක් එක් වැය විෂයයන්ගේ අඩුවීම, සියයට 27 සිට 90 දක්වා ප්‍රතිශතයක් වී තිබුණි. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කර නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර, මුදල් රෙගුලාසි 127(4) සහ 127(5) ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදන මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුවේ. | විගණන නිරීක්ෂණ සමග එකඟ වෙමි.<br>ලිපිලේඛන අනෙකුත් ආයතන වෙත භාරදීම පිණිස නිලධාරීන් යෙදවීම වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව සිදු කිරීම හා 2018 වර්ෂයේ අග භාගයේදී සිදුවූ දේශපාලනික වෙනස්වීම් හේතුවෙන් අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලට අදාල ලේඛන බෙදාහැරීම් සිදු නොකිරීම, ප්‍රවාහන දීමනාව නිලධාරීන් දෙනෙකු පමණක් ලබා ගැනීම, රාත්‍රී කාලයේ සේවයේ යෙදෙන නිලධාරීන්ට ආහාරපාන, අනෙකුත් සංග්‍රහ කටයුතු හා පවිත්‍රතා වියදම් වඩාත් යෝග්‍ය වැය විෂයයන් වෙත මාරු කිරීම, අරපිරිමැස්මෙන් යුතුව වියදම් |

| | | | |
|---|---|---|---|
| | | | දැරීම සහ දේපල ණය ලබාගැනීමට හිමිකම් සහිත නිලධාරීන් ඒ සඳහා ඉදිරිපත් නොවීම යනාදිය නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |
| (ඊ). | වැය විෂයයන් 07 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.19,700,000 ක මුලික වියදම් ඇස්තමේන්තු, වර්ෂය අවසානයට එකතුව රු.26,120,000 ක් දක්වා සංශෝධනය කර ගෙන තිබුණු අතර, ඒ අනුව එම වැය විෂයයන් 07 හි මුලික වියදම් ඇස්තමේන්තු අගයයන්ගේ මුළු වැඩිවීම සියයට 33 ක් හා එක් එක් වැය විෂයයන්ගේ වැඩිවීම, සියයට 8 සිට 600 ක් දක්වා ප්‍රතිශතයක් වී තිබුණි. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කර නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර, මුදල් රෙගුලාසි 127(4) සහ 127(5) ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදන මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුවේ. | විගණන නිරීක්ෂණය සමග එකඟ වෙමි. රජයේ නිවාඩු දිනවල හා සති අන්තයන්හි නිලධාරීන් සේවයේ යෙදවීම, ලිපිද්‍රව්‍ය මිල ඉහළ යාම, ඉන්ධන මිල ඉහළ යාම, සංචිත වාහන වසර 05 ක් ඉක්මවා තිබීම හේතුවෙන් වාහන නඩත්තු පිරිවැය ඉහළ යාම, නිල වාහන හිමි නිලධාරීන් සඳහා වෙන් කර ඇති වාහනවල අලුත්වැඩියාවන් කිහිපයක් සිදු කිරීම, ඇතැම් කාර්යාල උපකරණවල පැවති වෙළඳපොල මිල ඉහළ යාම හා මාණ්ඩලික නිලධාරියෙකුගේ අනපේක්ෂිත විදේශ සංචාරයක් සඳහා සම්පූර්ණ වියදම කාර්යාලය මගින් දැරීමට සිදුවීම යනාදිය නිසා අතිරේක ප්‍රතිපාදන අවශ්‍ය විය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

---------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ---------------------------- |
| (අ). | මුදල් රෙගුලාසි 94(2) ප්‍රකාරව, සැපයුම් හා සේවා සම්බන්ධයෙන් වාර්ෂිකව පුනරාවර්තනය වන වියදම්වලට අදාල එකතුව රු.443,635 ක් වූ බැරකම් පමණක් මූල්‍ය ප්‍රකාශනවල සටහන **(iv)** යටතේ වූ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දැක්විය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල සටහන **(iii)** යටතේ දක්වා තිබුණු සියළුම බැදීම් හා බැරකම්, එහි වාර්තා කර තිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල බැරකම් දැක්විය යුතුවේ. | විගණනයේ නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. අතපසුවීමකින් බැදීම් හා බැරකම් සියල්ලම, බැරකම් පිළිබඳ ප්‍රකාශයේ සටහන් වී ඇත. මින් ඉදිරියට එවැනි තත්ත්වයන් ඇති නොවීමට වගබලාගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| (ආ). | 2018 නොවැම්බර් 21 දිනැති අංක | බැදීම් හා බැරකම් | 2018 වර්ෂය අවසානයේ |

| | | |
|---|---|---|
| 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව, මූලය ප්‍රකාශන සටහන-**(iii)** යටතේ වන බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය, භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශය සමග එකඟ විය යුතු විය. එහෙත් මූල්‍ය ප්‍රකාශවල සටහන-**(iii)** යටතේ වාර්තා කර තිබුණු පුනරාවර්තන වියදම් සඳහා වූ බැඳීම් හා බැරකම්වල එකතුව රු.650,349 ක්වූ නමුත්, කාර්යාලය වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබුණු බැඳීම් හා බැරකම් ශේෂ පිළිවෙලින්, පුනරාවර්තන වියදම් සඳහා එකතුව රු.784,179 ක් හා මූලධන වියදම් සඳහා එකතුව රු.176,403 ක් වශයෙන් මුළු බැඳීම් හා බැරකම්වල එකතුව රු.960,582 ක් විය. | ගිණුම්ගත කිරීමේදී සහ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කිරීමේදී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සිදු කළ යුතුවේ. | භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති බැඳීම් හා බැරකම් ලේඛනයේ සඳහන්ව ඇත්තේ 2018 දෙසැම්බර් මස මුලදී අක්මුදල් ඉල්ලුම් කිරීම සඳහා අපවිසින් සිගාස් පරිගණක පද්ධතියට ඇතුළත් කරන ලද තොරතුරු **(Commitments)** වන අතර, එම බැඳීම් සියල්ලම 2018 දෙසැම්බර් 31 දින වන විට නිරවුල් කර තිබුණි. |

**3. සමාලෝචනය මෙහෙයුම්**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

කාර්යාලය වෙනත් ගොඩනැගිල්ලක ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය 2016 වර්ෂයේ සිට 2019 ජූලි 01 දින දක්වාම ඉටු කර ගැනීමට කාර්යාලය අපොහොසත් වීම හේතුවෙන් පහත තත්ත්වයන් නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ). | 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා, කාර්යාල පරිශ්‍රය ස්ථානගත කිරීමට යෝජිත ගොඩනැගිලි පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම් වෙනුවෙන්, එකතුව රු.16,500,000 ක අයවැය ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත්, එම වර්ෂ 03 තුළ වියදම්වල එකතුව රු.145,816 ක් පමණක් වූ බැවින්, ඇස්තමේන්තුගත | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කර නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර, මුදල් රෙගුලාසි 127(4) සහ 127(5) ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදන මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුවේ. | සැලසුම් කළ පරිදි මෙම කාර්යාලය කැප්පෙටිපොළ මාවතේ පිහිටි ගොඩනැගිල්ල හෝ ශ්‍රාවස්ති පරිශ්‍රයේ පිහිටි ගොඩනැගිල්ල වෙත හෝ රැගෙන යාමට නොහැකි වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුව ඇති බව පෙන්වා දෙමි. |

| | | |
|---|---|---|
| ප්‍රතිපාදනයෙන් ඉතිරිය සියයට 99 ක් වී තිබුණි. | | |
| (ආ). 2017 සහ සමාලෝචිත වර්ෂය තුළ මූලධන වත්කම් අත්පත් කරගැනීම් වෙනුවෙන්, එකතුව රු.5,500,000 ක අයවැය ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත්, වර්ෂ දෙක තුළ වියදම්වල එකතුව රු.1,430,245 ක් පමණක් වූ බැවින්, ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් ඉතිරිය සියයට 65 ක් විය. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කර නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර, මුදල් රෙගුලාසි 127(4) සහ 127(5) ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදන මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුවේ. | සැලසුම් කළ පරිදි මෙම කාර්යාලය කැප්පෙටිපොළ මාවතේ පිහිටි ගොඩනැගිල්ල හෝ ශ්‍රාවස්ති පරිශ්‍රයේ පිහිටි ගොඩනැගිල්ල වෙත හෝ රැගෙන යාමට නොහැකි වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුව ඇති බව පෙන්වා දෙමි. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාර්යාලයේ ලේඛන සංරක්ෂණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්වලදී පරිගණකගත ක්‍රමවේදයක් යටතේ එකී ලේඛණවල පිටපත් කඩිනමින් ලබා ගැනීම අරමුණු කරගෙන ලේඛන සංරක්ෂණය සහ කළමණාකරණ ක්‍රමවේදයන් ස්ථාපනය කිරීම සඳහා මූලධන ආයෝජන වශයෙන්, 2015, 2016 සහ 2017 වර්ෂවල අයවැය ඇස්තමේන්තු මගින් එකතුව රු.13,000,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත්, 2017 වර්ෂය අවසානය දක්වා එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි. එසේ වුවද, ව්‍යාපෘතිය සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සහ ව්‍යාපෘතියේ සමස්ත වියදම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (**ICTA**) විසින් දැරීමට එකඟ වීම හේතුවෙන්, මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය තුළදීද අදාල ආයතනය මගින් හෝ ව්‍යාපෘති නිම කරවාගැනීමට | යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක වීම හෝ නොවීමට හේතු සම්බන්ධයෙන් පසුවිපරම් සිදු කළ යුතුවේ. | විගණන නිරීක්ෂණය සමග එකඟ වෙමි. යෝජිත ව්‍යාපෘතියේ පවතින තාක්ෂණික සංකීර්ණභාවය හේතුවෙන් ව්‍යාපෘතිය සැලසුම් කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවූ බව පෙන්වා දෙමි. මේ වනවිට ICTA ආයතනය විසින් අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවාවන් ලබාගැනීම පිණිස, උනන්දුවක් දක්වන ආයතන වෙතින් අභිලාෂය ප්‍රකාශ කිරීම කැඳවීම 2018 අගෝස්තු 19 දින සිදු කරනු ලැබ ඇත. ඒ අනුව දැනට එම ආයතනය විසින් එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාලව කටයුතු කරගෙන යන බව පෙන්වා දෙනු කැමැත්තෙමි. |

කටයුතු කර නොතිබුණි.

## 3.3 ප්‍රසම්පාදනයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ). | සමාලෝචිත වර්ෂයේ 1201-ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා වැය විෂයය සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.5,000,000 ක් හා වර්ෂය අවසානයට ශුද්ධ වියදම රු.4,942,719 ක් වී තිබුණු නමුත්, එම ප්‍රසම්පාදන කටයුතු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් සලසා ගනු ලබන ප්‍රතිපාදන වියදම් කිරීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පරිභෝජ්‍ය ස්වරූපයේ භාණ්ඩ බැවින් ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. කෙසේ වුවද ඉදිරියේදී එවැනි මිලදී ගැනීම්ද වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ). | 2102 වැය විෂයය යටතේ සමාලෝචිත වර්ෂය තුළ සිදු කර තිබුණු ප්‍රසම්පාදනයන්, ප්‍රසම්පාදන සැලැස්මෙහි දක්වා තිබුණු කාලරාමු තුළ සිදු වී නොතිබුණු අතර, එම වැය විෂයය යටතේ ප්‍රසම්පාදනයන්හි ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු.4,000,000 ක් විය. ප්‍රසම්පාදන සැලැස්ම අනුව, කැප්පෙටිපොල මාවතේ ගොඩනැගිල්ල සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් රු.1,050,000 ක ඇස්තමේන්තුගත පිරිවැයට අදාල ප්‍රසම්පාදනයන් ඉටු වී නොතිබියදීත්, එම වැය විෂයය යටතේ සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රු.4,228,509 ක් වී තිබුණි. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් සලසා ගනු ලබන ප්‍රතිපාදන වියදම් කිරීමේදී ගිණුම්ගත කරනු ලබන වැය විෂයයන් නිවැරදිව හඳුනාගෙන සැලසුම් පිළියෙල කළ යුතු අතර, ඒ අනුව ප්‍රසම්පාදනයන් සිදු කිරීමට වගබලා ගත යුතුවේ. | මෙම කාර්යාලයේ රාජකාරී ස්වභාවය අනුව මාණ්ඩලික නිලධාරීන් ප්‍රසම්පාදන කටයුතු සඳහාද යෙදෙන අතර, ඇතැම් අවස්ථාවලදී ප්‍රසම්පාදන සැලැස්මෙහි කාලරාමු ඒ ආකාරයෙන්ම පිළිපැදීමට හැකියාවක් නොමැත. 2102 වැය විෂයය යටතේ රු.මිලියන 4 ක ප්‍රතිපාදන වෙන් කර ගත් නමුත්, වර්ෂය තුළ දෛනික රාජකාරී අවශ්‍යතා සඳහා කාර්යාල උපකරණ මිලදී ගැනීමට සිදුවීම හේතුවෙන් වෙන් කර ගනු ලැබූ ප්‍රතිපාදන ඉක්මවා රු.228,509 ක් වැය කර ඇත. |

(ඇ). සමාලෝචිත වර්ෂය තුළ රු.2,047,000 ක් වටිනා බහුකාර්ය ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය | අනුකූල නොවීම | නිර්දේශය | කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (i). | 2.5.1(ආ), 2.6.1(අ)(i), 2.8.3, 4.3 | කාල සටහන් පිළියෙල කිරීම, තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම හා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීම සිදු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණනයේ නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. ඉදිරි ප්‍රසම්පාදනවලදී ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කිරීමට පියවර ගන්නා ලෙසටත්, මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමට හා නිසිපරිදි තාක්ෂණික ඇගයීම් කමිටු පිහිටුවීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. |
| (ii). | 5.3.13, 5.3.10, 6.3.1(ආ), 5.2 සහ 5.3 | ලංසු සුරක්ෂණයේ වටිනාකම, ලංසු වලංගු විය යුතු කාල සීමාව, ලංසු ලබාදිය යුතු ආකාරය, ලංසු කැඳවීමේ ලේඛන පිළියෙල කිරීම සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර, ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය සඳහා වූ අංක NPA/Goods/SBD 01 දරන සම්මත ලංසු කැඳවීමේ ලේඛනය ප්‍රකාරව ආකෘති පිළියෙල කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන සහ සම්මත ලංසු ලේඛනවල ආකෘති ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුවේ. | විගණනයේ නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. ඉදිරි ප්‍රසම්පාදනවලදී මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීමෙන් අනතුරුව ලංසු සුරක්ෂණයේ වටිනාකම තීරණය කරන ලෙසත්, සම්මත ලංසු ලේඛන භාවිතා කරන ලෙසත්, සම්මත ලංසු කැඳවීමේ ලේඛන තුළ එක් එක් කොටස් යටතේ තිබිය යුතු ලේඛන පිළියෙල කිරීමටත්, ඒ සඳහා නියමිත ආකෘති භාවිතා කිරීමටත්, අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. |
| (iii). | 6.1.1(අ) සහ 6.1.4 | ලංසු ලේඛන නිකුත් කිරීමේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව | විගණනයේ නිරීක්ෂණ සමග එකඟ වෙමි. ඉදිරි ප්‍රසම්පාදනවලදී මෙවන් කරුණු පිළිබඳ සැලකිලිමත් |

| | | | | |
|---|---|---|---|---|
| | | | කටයුතු කළ යුතුවේ. | වන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. |
| (iv). | 6.3.6 | ලංසු විවෘත කිරීමට අදාල තොරතුරු නියමිත ආකෘති ප්‍රකාරව වාර්තා කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සහ ප්‍රසම්පාදන අත්පොතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණනයේ නිරීක්ෂණ සමග එකඟ වෙමි. ලංසු විවෘත කිරීම සම්බන්ධ තොරතුරු අදාල ආකෘතිපත්‍ර අනුව වාර්තා කිරීම මේ වන විට ආරම්භ කර ඇත. |
| (v). | 8.9.1(ආ), 8.9.3 සහ අනුමත NPA/Goods/SBD 01 දරන සම්මත ලංසු ලේඛනයේ Section VIII යටතේ දැක්වෙන සම්මත ගිවිසුම් ආකෘතිය | සම්මත ගිවිසුම් ආකෘතිය ප්‍රකාරව, කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණු අතර, යන්ත්‍රයේ වගකීම් කාලය අවසාන වූ පසු දැරිය යුතු නඩත්තු පිරිවැය සහ මිලදී ගැනීමෙන් පසු වර්ෂ 05 ක් දක්වා අමතර කොටස් ඇති බවට තහවුරු කර ගැනීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමග එකඟතාවයකට පත්වී නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සහ සම්මත ලංසු ලේඛනවල ආකෘති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණනයේ නිරීක්ෂණ සමග එකඟ වෙමි. මේ වන විට ගිවිසුම්වලට එළඹීම ආරම්භ කර ඇත. |

(ඇ). එකතුව රු.1,185,000 ක් වටිනා පරිගණක යන්ත්‍ර 05 ක් ලැප්ටොප් යන්ත්‍ර 03 ක් සහ යූපීඑස් යන්ත්‍ර 20 ක් මිලදී ගැනීමට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂිත කරුණු පහත පරිදි විය.

| | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය | අනුකූල නොවීම | නිර්දේශය | කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | ------------------- | ------------------- | ----------- | ------------------------------ |
| (i). | 2.5.1(ආ) සහ 2.6.1(අ)(**i**) | ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්මෙහි දක්වා තිබුණු කාලසීමාවන් තුළ ප්‍රසම්පාදනය සිදුවී නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු සිදු යුතුවේ. | විගණනයේ නිරීක්ෂණ සමග එකඟ වෙමි. ඉදිරි ප්‍රසම්පාදනවලදී කාලසටහනක් සකස් කර එකී කාලසටහනට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කළ යුතු බවට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදී. |
| (ii). | 2.8.3, 4.3 | තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරීම, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන සහ ප්‍රසම්පාදන අත්පොතේ 2.7.4 හි දැක්වෙන ආකෘතිය ප්‍රකාරව සිදු කර නොතිබුණු අතර, මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සහ ප්‍රසම්පාදන අත්පොතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණනයේ නිරීක්ෂණ සමග එකඟ වෙමි. ඉදිරි ප්‍රසම්පාදනවල තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීමේදී නියමිත ආකෘති භාවිතා කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. ඉදිරියේදී අදාළ පත්කිරීම් මවිසින් සිදු කිරීමට සටහන් කරගෙන ඇත. එසේම ඉදිරි ප්‍රසම්පාදනවලදී මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. |
| (iii). | 5.2, 5.3, 5.3.13 | ලංසු සුරක්ෂණයේ වටිනාකම තීරණය කිරීම අදාල මාර්ගෝපදේශ විධිවිධාන ප්‍රකාරව සිදු කර නොතිබුණු අතර, අංක NPA/SBD/Goods/01 දරන සම්මත ලංසු කැඳවීමේ ලේඛනය අනුව, ලංසු කැඳවීමේ ලේඛනවල ආකෘති පිළියෙල කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන සහ සම්මත ලංසු කැඳවීමේ ලේඛනවල ආකෘති ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුවේ. | විගණනයේ නිරීක්ෂණ සමග එකඟ වෙමි. ඉදිරි ප්‍රසම්පාදනවලදී මුළු ඇස්තමේන්තුවක් සකස් කිරීමෙන් අනතුරුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුගමනය කරමින් ලංසු සුරක්ෂණයේ වටිනාකම තීරණය කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. තවද ඉදිරි ප්‍රසම්පාදනවලදී සම්මත ලංසු කැඳවීමේ ලේඛන භාවිතා කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. |

| | | | | |
|---|---|---|---|---|
| (iv). | 5.3.16(ආ), (ඇ) සහ ප්‍රසම්පාදන අත්පොතේ 7.9.2(ස) | ලංසු ඇගයීමේදී සහ තීරණ ගැනීමේදී, අදාල විධිවිධානවලින් බැහැරව කටයුතු කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන සහ ප්‍රසම්පාදන අත්පොතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණනයේ නිරීක්ෂණ සමග එකඟ වෙමි. මෙම කරුණ සම්බන්ධයෙන් ඉදිරියේදී සැලකිලිමත් වන ලෙස අදාල නිලධාරීන්ට තරයේ උපදෙස් ලබාදෙන ලදී. |
| (v). | 8.5.1 සහ 8.5.2 | ප්‍රසම්පාදන කමිටු තීරණය ලංසු තීරණය පිළිබඳ ලංසුකරුවන් වෙත දැනුම්දීම සහ තෝරාගත් ලංසුකරුවන් වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම, අදාල විධිවිධාන ප්‍රකාරව සිදු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. ඉදිරි ප්‍රසම්පාදන කටයුතුවලදී ප්‍රසම්පාදන කමිටු තීරණ සියලු ලංසුකරුවන් වෙත දැනුම් දෙන ලෙස අදාල නිලධාරීන්ට දැනුම් දෙන ලදී. |
| (vi). | 8.9.1(ආ) සහ 8.9.3 | එකතුව රු.1,115,000 ක් වූ පරිගණක යන්ත්‍ර 05 ක් සහ ලැප්ටොප් යන්ත්‍ර 03 ක් මිලදී ගැනීමට අදාලව අත්සන් කර තිබුණු කොන්ත්‍රාත් ගිවිසුමෙහි වටිනාකම, ගිවිසුම සමග අමුණා තිබුණු ඇමුණුමට අනුව නිවැරදි නොවූ අතර, කොන්ත්‍රාත් ගිවිසුමෙහි කොන්ත්‍රාත්කරුගේ නිල මුද්‍රාව තබා නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණනයේ නිරීක්ෂණ සමග එකඟ වෙමි. විගණනය පෙන්වා දී ඇති පරිදි අදාළ නිවැරදි ලේඛන ගිවිසුමට අමුණා යාවත්කාලීන කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. |

**3.4 වත්කම් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල සටහන-(ii) ආකෘතියෙහි දක්වා තිබුණු, එකතුව රු.65,111 ක්වූ වාහන අනතුරු දෙකක අලාභ 2018 දෙසැම්බර් 31 දිනට අයවී නොතිබුණි. | අලාභ අයකර ගැනීම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කාර්යාලයේ දෛනික රාජකාරී කටයුතු සඳහා යෙදවීමට ප්‍රමාණවත් වාහන නොමැතිවීම හේතුවෙන් 2018 සැප්. 14 දින අනතුරට ලක්වූ වාහනය අලුත්වැඩියාව සඳහා යොමු කිරීමට නොහැකි වූ අතර, අනෙක් රථය මයික්‍රෝ වර්ගයේ රථයක් වන අතර, අදාල අමතර කොටස් මයික්‍රෝ ආයතනය සතුව නොපැවතීම හේතුවෙන් අලුත්වැඩියා සිදු කිරීම ප්‍රමාද වී තිබුණි. |

**4. යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණක තනතුරේ රාජකාරී කටයුතු සඳහා (ශ්‍රී.ලං.ග.සේ.I) නිලධාරිනියක පත් කර තිබුණු නමුත්, කාර්යාලයේ ඉඩකඩ සීමාසහිත වීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක වී නොතිබුණි. | කාර්යාලයේ අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුවේ. | මෙම කාර්යාලය සඳහා වෙන්කරනු ලබන අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය අනෙකුත් රාජ්‍ය ආයතන හා සසඳන කළ ඉතාමත් සුළු ප්‍රමාණයක් වීමත්, වෙනත් රාජ්‍ය ආයතනවල මෙන් විවිධ ව්‍යාපෘති හෝ වැඩසටහන් මෙම කාර්යාලය විසින් ක්‍රියාත්මක කරනු නොලැබීමත් යන කරුණු හේතුවෙන් මෙම කාර්යාලය සඳහා අතිරේක වියදමක් දරමින් අභ්‍යන්තර විගණක තනතුරක් පැවතීමේ දැඩි අවශ්‍යතාවයක් නොපවතී. |

**5. මානව සම්පත් කළමනාකරණය**

**5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත නිලධාරීන් 115 ක්ද, තථ්‍ය නිලධාරීන් 75 ක්ද සහ පුරප්පාඩු 75 ක්ද විය.